# සටහන

2016 නොවැ - දෙසැ

11 - 12 කලාපය




2 මියන්මාරයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 තිරසාර සංවර්ධන අභිමතාර්ථ

6 ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව නවීකරණය කිරීම

9 ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් පිළිබඳ සමීක්ෂණයේ ප්‍රධාන නිරීක්ෂණයන්

12 විදුලිබල උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති

16 බැංකුවල සුරක්ෂිතභාවය සහ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා හඳුන්වා දෙන ලද නව නියාමන සහ අධීක්ෂණ ක්‍රමවේද


රු. 20/-


ISSN 1391-3697

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව



# මියන්මාරය

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...






කලින් බුරුමය ලෙස හැඳින්වූ මියෙන්මාරය අද නිල වශයෙන් හැඳින්වෙන්නේ මියෙන්මාර ජනරජ සමූහාණ්ඩුව නමින්. අග්නිදිග ආසියාතික ස්වෛරී රාජ්‍යයක් වන මෙය බටහිරින් ඉන්දියාව සහ බංගලාදේශයෙන් ද, නැගෙනහිරින් තායිලන්තයෙන් සහ ලාඕසයෙන් ද, උතුරින් සහ ඊසාන දෙසින් චීනයෙන් ද සීමා වී තිබෙනවා. සමස්ත වටප්‍රමාණයෙන් තුනෙන් දෙකක් පමණ වන දකුණු වෙරළ තීරය සීමා වී තිබෙන්නේ බෙන්ගාල බොක්කෙන් සහ අන්දමන් මුහුදෙන්. වත්මන් අගනුවර "නේපිටෝ" වන අතර කලින් අගනුවර ලෙස සැලකුණේ "රැන්ගුන්" නගරයයි.

"ටිබෙටෝ-බර්මන්" බස කතා කරන වැසියන් ඉහළ බුරුමයේ පදිංචි වීමෙන් ජනාවාස වීම ඇරඹුණු අතර ක්‍රි. ව. 9 වන සියවසේ දී ටිබැටයෙන් පැමිණි බාමර් ජාතිකයන් ඉරවඩි ගංගාවේ ඉහළ නිම්නයේ පදංචි වීමත් සමග ම මියෙන්මාරයේ ථෙරවාද බුදු දහම කැපී පෙනෙන ලෙස ව්‍යාප්ත වුණා. ශ්‍රී ලංකා සංඝ ශාසනයේ "අමරපුර මහ නිකාය" ආරම්භ වූයේ ද මියෙන්මාරයේ පැරණි අගනුවරක් වන "අමරපුරය" මුල් කරගෙනයි. 19 වන සියවසේ ඇතිවූ යුද්ධ තුනකින් පසු ව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වූ මියෙන්මාරය 1948 දී නිදහස ලැබුවා. 1962 දී ඇති වූ යුද්ධ හමුදා කුමන්ත්‍රණයකින් පසු හමුදා පාලනයකට නතු වුණු එය දීර්ඝ කාලීන සිවිල් යුද්ධයක පැටලුනා. 2011 දී හමුදා පාලනය අවසන් වුව ද අදටත් මියෙන්මාර හමුදාව එහි දේශපාලනය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරනවා.■

මූලාශ්‍ර - World Fact Book
Wikipedia විශ්වකෝෂය

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය<br>ගොඩ බිම් ප්‍රමාණය<br>අභ්‍යන්තර ජලාශ | <br>වර්ග කි.මී. 676,578<br>වර්ග කි.මී. 653,508<br>වර්ග කි.මී. 23,070 |
| ජනගහනය (2017 ජූලි ඇස්තමේන්තු) | 55,123,814 |
| ජනගහන වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 0.91% |
| උපත් අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 18.1 |
| මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 7.4 |
| උපතේදී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2017 ඇස්තමේන්තු) | 68.2 |
| ළදරු මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට) | 35.8 |
| සේවා වියුක්තිය (2017 ඇස්තමේන්තු) | 4% |
| ශ්‍රම බලකාය (2017 ඇස්තමේන්තු) | මිලියන 22.3 |
| දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 330.9 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 7.2% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 6,300 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු)<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>24.8%<br>35.4%<br>39.9% |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (2017 ඇස්තමේන්තු) | -3.3% |
| උද්ධමන අනුපාතය (2017 ඇස්තමේන්තු) | 6.5% |
| ආනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 15.33 |
| ආනයන භාණ්ඩ | රෙදිපිළි, ඛනිජ තෙල්, නිෂ්පාදන, පොහොර, ප්‍රවාහන යන්ත්‍රෝපකරණ, සිමෙන්ති, ප්ලාස්ටික්, ඉදිකිරීම් අමුද්‍රව්‍ය, ආහාර නිෂ්පාදන |
| අපනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 10.7 |
| අපනයන භාණ්ඩ | දැව නිෂ්පාදන, ධාන්‍ය වර්ග, මාළු, සහල්, රෙදිපිළි, ස්වභාවික වායු, මැණික් |
| මුදල් ඒකකය | ක්යාත් - (Kyat - MMK) |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

# තිරසාර සංවර්ධන අභිමතාර්ථ

2015 සැප්තැම්බර් මාසයේ දී නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධාන ප්‍රධාන කාර්යාලයේ දී එක් රැස් වූ ලෝක නායකයින් විසින් වසර 2000 දී හඳුන්වා දෙන ලද සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සඳහා අනුප්‍රාප්තික අභිමතාර්ථ ලෙස, තිරසාර සංවර්ධන අභිමතාර්ථ[1] එළි දක්වන ලදී. සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ මෙන් නො ව, එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරි කමිටු ඇතුළු විවිධ රාජ්‍ය හා පුද්ගලික සංගම්වල පවත්වන ලද දීර්ඝ සහ සංකීර්ණ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉදිරිපත් කර ඇත. ප්‍රධාන වශයෙන් සැලකූ විට, තිරසාර සංවර්ධන අභිමතාර්ථ ව්‍යුහය දිළිඳුකම පිටුදැකීම, පෘථිවිය ආරක්ෂා කිරීම සහ සැමට සෞභාග්‍යය උදා කිරීම සඳහා වූ ක්‍රියාකාරි සැලැස්මකි. දිළිඳුකම, තිරසාර සංවර්ධනය සඳහා ඇති ප්‍රධානතම බාධකය ලෙස හඳුනා ගෙන ඇති අතර ඒ අනුව, අන්ත දිළිඳුකම ඇතුළු සියලු ආකාරයේ දිළිඳු බව පිටුදැකීමට තිරසාර සංවර්ධන අභිමතාර්ථ විශේෂ අවධානයක් යොමු කර ඇත. තිරසාර සංවර්ධන අභිමතාර්ථ ව්‍යුහය ලෝකය තිරසාර, ස්ථායි සංවර්ධන මාවතකට යොමු කිරීමට දායක වන පැහැදිලි පරිවර්තනාත්මක මුල් පිරීම් රැසක් අරමුණු කර ඇත. එකිනෙකට තදින් බැඳී පවතින ඒකාබද්ධ තිරසාර සංවර්ධන අභිමතාර්ථ, තිරසාර සංවර්ධනය සඳහා ආර්ථික, සමාජීය සහ පාරිසරික යන ත්‍රිවිධ අංශය ම සමබර ව පවත්වා ගෙන යන අතර සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ මත ගොඩ නැගී ඇති ඒවා ඒ යටතේ සාක්ෂාත් කර ගැනීමට නො හැකි වූ අභිමතාර්ථ සපුරා ගැනීමට ද ප්‍රයත්න දරයි. මෙම අභිමතාර්ථ සහ ඉලක්ක මානව සංහතියේ අභිවෘද්ධිය සඳහා ඉතා වැදගත් පුළුල් පරාසයක් ආවරණය වන නව පියවර රැසකින් සමන්විත වන අතර ඒවා, 1 වන වගුවේ දක්වා ඇති පරිදි, පුළුල් ක්ෂේත්‍ර පහක් යටතේ දැක්විය හැකි ය.[2]

1 පහත සඳහන් ප්‍රමුඛ අර්ථකථනය ද ඇතුළත් ව, තිරසාර සංවර්ධනය නිර්වචනය කරන විවිධ ක්‍රම තිබේ: "ස්වකීය පරපුරේ අවශ්‍යතා සපුරාගැනීම සඳහා අනාගත පරපුරට ඇති හැකියාව කැප නොකර වත්මන් අවශ්‍යතා සපුරා ගන්නා සංවර්ධනය තිරසාර සංවර්ධනයයි" - බ්‍රන්ට්ලන්ඩ් කොමිසම (1987)

2 වැඩි විස්තර සඳහා බලන්න: https://sustainabledevelopment.un.org/post2015/transformingourworld

1 වන රූප සටහන

**තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17**




මූලය: https://sustainabledevelopment.un.org/sdgs

1 වන වගුව

**තිරසාර සංවර්ධන අභිමතාර්ථ යොමු වී ඇති පුළුල් ක්ෂේත්‍ර පහ**

| පුළුල් ක්ෂේත්‍රය | විස්තරය |
|---|---|
| ජනතාව | සියලු ආකාර මාන තුළ, දිළිඳුකම සහ සාගින්න අවසන් කිරීම හා ගෞරවය, සමානාත්මතාව සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයක් තුළ සියලු මානව වර්ගයා තමන්ගේ කුසලතා සපුරා ගන්නා බව තහවුරු කිරීම |
| පෘථිවිය | වත්මන් සහ අනාගත පරපුරේ අවශ්‍යතා සඳහා සහාය විය හැකි වන පරිදි, තිරසාර පරිභෝජන නිෂ්පාදන හරහා ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය සහ දේශගුණික විපර්යාස සඳහා කඩිනම් පියවර ගනිමින්, පෘථිවිය ගෞරවනීය ලෙස ආරක්ෂා කිරීම |
| සෞභාග්‍යය | සියලු මනුෂ්‍ය වර්ගයා සමෘද්ධිමත් හා තෘප්තිමත් ජීවිත භුක්ති විඳින බව සහ ආර්ථික, සමාජීය සහ තාක්ෂණික ප්‍රගතිය ස්වභාව ධර්මය සමඟ එකමුතු ව සිදු වන බව තහවුරු කිරීම |
| සාමය | බිය හා ප්‍රචණ්ඩත්වයෙන් තොර, සාමකාමී, සාධාරණ සහ සියලු දෙනා එක් කර ගත් සමාජයක් සඳහා ධෛර්යය ලබා දීම |
| හවුල් කටයුතු | මෙම න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට, ගෝලීය සහයෝගීතාව පදනම් කර ගෙන දිළිඳුකම හා වඩාත් පීඩාවට ලක් වූ ජනතාව කෙරෙහි විශේෂ අවධානයකින් යුතු ව, තිරසාර සංවර්ධනය සඳහා බල පවත්වන ලද ගෝලීය හවුල්කරුවන්ගෙන් හා සියලු රටවලින්, සියලු පාර්ශවකරුවන්ගෙන් හා සියලු ජනතාවගේත් දායකත්වය ලබා ගෙන ක්‍රියාත්මක වීම |

මූලය: https://sustainabledevelopment.un.org/post2015/transformingourworld

ඒ අනුව තිරසාර සංවර්ධන අභිමතාර්ථ න්‍යාය පත්‍රය, තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17ක් ප්‍රකාශයට පත් කරමින් මෙම සහයෝගීතා ගමන් මග ආරම්භ කළ අතර මෙම සෑම අභිමතාර්ථයක් ම ඊට විශේෂිත වූ ඉලක්ක කිහිපයකින් සමන්විත වේ. තිරසාර සංවර්ධනය පිළිබඳ පුළුල් පරාසයක ගැටලු ආවරණය කෙරෙන මෙම ඉලක්කවල එකතුව 169ක් වේ.

| | |
|---|---|
| අභිමතාර්ථ 1 | සියලු ආකාරයේ දිළිඳුබව, සියලු තැන්හි ම දුරු කිරීම |
| අභිමතාර්ථ 2 | කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතාව හා පෝෂණ වැඩිදියුණුව ලබා ගැනීම සහ තිරසාර කෘෂිකාර්මික ප්‍රවර්ධනය |
| අභිමතාර්ථ 3 | සෑම වයසක ම සියලු දෙනාට ම, සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම |
| අභිමතාර්ථ 4 | සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරා ම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම |
| අභිමතාර්ථ 5 | ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාව ළඟා කර ගැනීම සහ සියලු ම කාන්තාවන් හා ගැහැනු ළමුන් සවිබල ගැන්වීම |
| අභිමතාර්ථ 6 | සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගත හැකි බව හා තිරසාර කළමනාකරණය සහතික කිරීම |
| අභිමතාර්ථ 7 | දැරිය හැකි, විශ්වසනීය, තිරසාර හා නවීන බලශක්ති ප්‍රවේශය සියලු දෙනා සඳහා තහවුරු කිරීම |
| අභිමතාර්ථ 8 | සියලු දෙනා සඳහා කල්පවත්නා, පූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම |
| අභිමතාර්ථ 9 | ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම, පූර්ණ සහ තිරසාර කාර්මිකකරණය සහ නව නිපැයුම් ප්‍රවර්ධනය |
| අභිමතාර්ථ 10 | රටවල් ඇතුළත හා රටවල් අතර අසමානතාව අඩු කිරීම |

අභිමතාර්ථ 11 නගර හා මානව ජනාවාස, පූර්ණ, ආරක්ෂිත, ඔරොත්තු දෙන, තිරසාර තත්ත්වයට පත් කිරීම

අභිමතාර්ථ 12 පරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම

අභිමතාර්ථ 13 දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහි ව හදිසි ක්‍රියාමාර්ග ගැනීම

අභිමතාර්ථ 14 තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු හා සාගර සම්පත් සුරක්ෂිතව, කල් පවත්නා පරිදි භාවිත කිරීම

අභිමතාර්ථ 15 ගොඩබිම් පරිසර පද්ධති තිරසාර ලෙස භාවිත කිරීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා පිළිසකර කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැළැක්වීමට කටයුතු කිරීම හා ඉඩම් අවභාවිතය නැවැත්වීම හා පිළිසකර කිරීම සහ ජෛව විවිධත්වයට හානිවීම නතර කිරීම

අභිමතාර්ථ 16 තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාට ම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායී, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම

අභිමතාර්ථ 17 තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාව ක්‍රියාත්මක කළ හැකි විධික්‍රම හා නව පණගැන්වීම් ශක්තිමත් කිරීම

බහුවිධ අන්තර් සම්බන්ධතා සහිත ව තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඒකාබද්ධ ස්වභාවයකින් පැවතීම තිරසාර සංවර්ධනයේ විවිධාකාර පැතිකඩ සාක්ෂාත් කර ගැනීමට ඉතා වැදගත් වේ. එ බැවින්, තිරසාර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ඒවා ජාතික/කලාපීය සැලසුම් ප්‍රමුඛතා සහ ප්‍රකාශනවලට ඒකාබද්ධ කිරීම අවශ්‍ය වන අතර, තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17 ම ඉතා සම්බන්ධිත බැවින් හා එකිනෙකින් හුදකලාව ක්‍රියාත්මක කළ නො හැකි බැවින් විවිධ අංශ ඒකාබද්ධ වී කටයුතු කිරීම දිරිමත් කළ යුතු වේ. ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීමේ දී අවශ්‍යතා හා ධාරිතාවන් සපුරාලීම ද අවශ්‍ය වේ. විවිධ මට්ටමේ රාජ්‍ය හා පාර්ශ්වකාර කණ්ඩායම් අතර ප්‍රමුඛතාව මත සහයෝගීතා හා දායකත්ව පියවර ගැනීම ද අවශ්‍ය වනු ඇත. සියල්ලන්ගේ ජීවිත සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීමට නම්, සියලු මට්ටම්වලින් ගනු ලබන ප්‍රයත්නයන් සමස්ත තිරසාර සංවර්ධන අභිමතාර්ථ න්‍යාය පත්‍රය කෙරෙහි අවධානය යොමු කරමින් සිදු කළ යුතු ව ඇත.

මුළු සංඛ්‍යාව 169ක් වන සම්පූර්ණ තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක අතරින් කිහිපයක්, විශේෂයෙන් ම මාතෘ, ළමා සහ ළදරු මරණ සම්බන්ධයෙන් වන ඉලක්කයන් ශ්‍රී ලංකාව දැනටමත් සම්පූර්ණ කර ඇත. තව ද, රජය විසින් හඳුන්වා දී ඇති නීල-හරිත සංවර්ධන උපාය මාර්ගය වැනි නව මුල්පිරීම්, පාරිසරික ගැටලු විසඳන අතර, අදාළ තිරසාර සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීමට දායක වනු ඇත. මෙ වන් ප්‍රගතියක් ලබා තිබුන ද, 2030 දී රට තුළ තිරසාර සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා, සෑම පාර්ශ්වයක ම සහභාගීත්වයක් ඇති ව සාමූහික ශක්තිමත් ප්‍රයත්නයක් දැරිය යුතු ව ඇත.

මූලාශ්‍ර :

World Commission on Environment and Development (the Brundtland Commission), *Our Common Future*, Oxford University Press (1987).

https://sustainabledevelopment.un.org/post2015/transformingourworld

http://www.un.org/sustainabledevelopment/sustainable-development-goals/

https://sustainabledevelopment.un.org/sdgs

(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015)

# ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව නවීකරණය කිරීම

## ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුවේ විකාශය

මුදල් තත්ත්වයන් හා මිල ගණන්වල වර්ධනය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රතිපත්තිය පසුගිය වසර හැට හයක කාලය පුරා ක්‍රමික ව විකාශය වී ඇත. 1977 දක්වා ක්‍රියාත්මක වූ ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය යටතේ මෙන් ම, 2001 දී පාවෙන විනිමය අනුපාතික ක්‍රමයට අනුගත වන තුරු පැවති පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය තුළ, උද්ධමන අපේක්‍ෂා පාලනය කර ගැනීම සඳහා විනිමය අනුපාතික ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේ ය. 1980 දශකයේ මුල් භාගයේ දී, මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස මුදල් ඉලක්කකරණය (Monetary Targeting) තෝරා ගත් අතර ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය හැසිරවීමේ දී ප්‍රධාන අතරමැදි විචල්‍ය බවට මුදල් සමස්ත පත් විය. ඒ අනුව, මුදල් ගුණකය හරහා සංචිත මුදල් සමඟ බැඳී ඇති, අතරමැදි ඉලක්කය වන පුළුල් මුදල් සමස්ත පාලනය කිරීම තුළින් අවසාන ඉලක්කය වන මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සිදු විය. මෙම රාමුව යටතේ, මුදල් ප්‍රතිපත්තියෙහි මෙහෙයුම් ඉලක්කය වශයෙන් සංචිත මුදල් ක්‍රියාත්මක විය. මුදල් ඉලක්කකරණ රාමුව ක්‍රියාත්මක කිරීමේ දී අපේක්‍ෂිත රාජ්‍ය මූල්‍ය හා ගෙවුම් තුලන වර්ධනයන්, අපේක්‍ෂිත ආර්ථික වර්ධනය හා ණය වර්ධනය මෙන් ම අපේක්ෂිත උද්ධමන මට්ටම යනාදී විවිධ සාධක සලකා බලමින් සෑම වසරක් සඳහා ම මහ බැංකුව විසින් සකසනු ලබන වාර්ෂික මුදල් වැඩසටහන මත පදනම් වූ සංචිත මුදල් හා පුළුල් මුදල් සඳහා ඉලක්ක ප්‍රකාශයට පත් කිරීමත්, ඉන්පසු එම මුදල් සමස්තවල වර්ධනය නිරීක්ෂණය කිරීමත් අවශ්‍ය විය.

## මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි මෑතකාලීන ජාත්‍යන්තර ප්‍රවණතා

මුදල් ඉලක්කකරණ රාමුව යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී අවසාන ඉලක්ක විචල්‍ය සහ අතරමැදි නාමික විචල්‍ය අතර ශක්තිමත්, විශ්වසනීය සම්බන්ධතාවක් ඇති බවට උපකල්පනය කෙරේ. එහෙත් මෙම සම්බන්ධතාව දුර්වල නම්, මුදල් සමස්ත ඉලක්කකරණය නිසි පරිදි ක්‍රියාත්මක නො වනු ඇති අතර, ඒ මගින් මුදල් ප්‍රතිපත්තියේ අපේක්‍ෂිත ප්‍රතිඵල ලබා නො දීමට ඉඩ ඇත. මෙය ලොව බොහෝ රටවලට විශේෂ ගැටලුවක් වූ අතර, උද්ධමනය මෙන් ම, මුදල් ඉල්ලුම් ශ්‍රිතයේ වෙනස්වීම් වැනි, ඉලක්ක විචල්‍යය හා මුදල් සමස්ත අතර සම්බන්ධතාව බිඳ වැටීම හේතුවෙන් බොහෝ රටවල් සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස උද්ධමන ඉලක්කකරණය (Inflation Targeting) තෝරා ගෙන ඇත.

1. සංඛ්‍යාත්මක උද්ධමන ඉලක්කයක් ප්‍රකාශයට පත් කිරීම
2. ඉදිරි දැක්මකින් යුතු ව මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමට ඉවහල් වන උද්ධමන උද්ධමන පුරෝකථන උපයෝගී කර ගැනීම
3. ඉහළ මට්ටමේ විනිවිදභාවය හා වගවීම

යන කරුණු උද්ධමන ඉලක්කකරණ රාමුවක ප්‍රධාන ලක්ෂණ අතර වේ. සාමාන්‍යයෙන් උද්ධමන ඉලක්කකරණ රාමුව උද්ධමන අපේක්ෂා සඵලදායී ලෙස පාලනය කිරීමට හේතු වන මිල ස්ථායිතාව,

1 වන සංඛ්‍යා සටහන

**උද්ධමන ඉලක්කකරණ රටවල්**

| උද්ධමන ඉලක්කකරණය ආරම්භ කළ වර්ෂය | රටවල්* |
|---|---|
| 1989 - 1994 | නවසීලන්තය, කැනඩාව, එක්සත් රාජධානිය, ස්වීඩනය, ඕස්ට්‍රේලියාව |
| 1995 - 1999 | චෙක් ජනරජය, ඊශ්‍රායලය, පෝලන්තය, දකුණු කොරියාව, බ්‍රසීලය, චිලී, කොලොම්බියාව |
| 2000 - 2004 | දකුණු අප්‍රිකාව, තායිලන්තය, මෙක්සිකෝව, අයිස්ලන්තය, නෝර්වේ, හංගේරියාව, පේරු, පිලිපීනය |
| 2005 සිට මේ දක්වා | රුමේනියාව, ගෝතමාලාව, ඉන්දුනීසියාව, ආමේනියාව, තුර්කිය, ඝානාව, සර්බියාව |

* ස්ලෝවැකියාව, ෆින්ලන්තය හා ස්පාඤ්ඤය යන රටවල් උද්ධමන ඉලක්කකරණයට අවතීර්ණ වූ නමුත් ව්‍යවහාර මුදල ලෙස 'යූරෝ' භාවිතයට ගැනීම ඇරඹූ පසු එම රටවල් එයින් ඉවත් වී ඇත.


ස්වාධීනත්වය හා මහ බැංකුවේ වගවීම යන ලක්ෂණ තුනෙන් සමන්විත ආයතනික රාමුව සමඟ සම්බන්ධ වී ඇත (ස්වෙන්සන්, 2010). ඒ අනුව, කිසියම් රටක් උද්ධමන ඉලක්කකරණ රාමුවකට අනුගත වීමට පෙර හෝ ඊට සමාන්තර ව සිය ආයතනික සැකැස්ම, නීති රාමුව හා මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණයේ සඵලදායිත්වය යනාදී පූර්ව අවශ්‍යතා රැසක් සපුරාලිය යුතු ය.

පමණක් ස්ථායී කිරීමට උත්සාහ කිරීමකි (ස්වෙන්සන්, 2009).

සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති රටවලට අමතර ව, 2015 පෙබරවාරි මස 1 වැනි දින ඉන්දියානු සංචිත බැංකුව සහ ඉන්දීය මුදල් අමාත්‍යාංශය, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් මත පදනම් වූ මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීමට එකඟත්වයකට පැමිණ

2 වන රූප සටහන

**ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි නවීකරණ**




1989 දී නවසීලන්තය උද්ධමන ඉලක්කකරණ රාමුවට අවතීර්ණ වීමෙන් පසු 1 වන සංඛ්‍යා සටහනේ දැක්වෙන පරිදි රටවල් රැසක් උද්ධමන ඉලක්කකරණයට අවතීර්ණ වී ඇත.

ප්‍රායෝගික වශයෙන්, උද්ධමන ඉලක්කකරණය දැඩි ව නො ව නම්‍යශීලී ලෙස ක්‍රියාත්මක වන අතර, උද්ධමන ඉලක්කකරණය භාවිත කරන මහ බැංකු, උද්ධමන ඉලක්කයක් ආසන්නයේ උද්ධමනය ස්ථාවර කිරීමට පමණක් නොව ආර්ථිකයේ වෙනත් සාර්ව ආර්ථික විචල්‍ය ද ස්ථායි කිරීමට උත්සාහ දරයි. ඒ අනුව උද්ධමන ඉලක්කකරණය භාවිත කරන මහ බැංකු, දැඩි උද්ධමන ඉලක්කකරණය වෙනුවට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක් (Flexible Inflation Targeting) ක්‍රියාත්මක කරයි. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යනුවෙන් අදහස් වන්නේ, උද්ධමන ඉලක්කයක් ආසන්නයේ උද්ධමනය මෙන් ම මූර්ත ආර්ථිකය ද ස්ථායි කිරීම වන අතර, දැඩි උද්ධමන ඉලක්කකරණයේ දී සිදුවන්නේ මූර්ත ආර්ථිකය පිළිබඳ ව එතරම් සැලකිලිමත් නො වී හුදෙක් උද්ධමනය

ඇත. මෙම රාමුව යටතේ, සියයට +/- 2 ක පරාසයක් තුළ, පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ උද්ධමනය, 2016 ජනවාරි වන විට සියයට 6කට අඩු මට්ටමක ද, 2016-2017 කාලය තුළ සියයට 4ට අඩු මට්ටමක ද පවත්වා ගැනීමට ඉලක්ක කර ඇත.

## ශ්‍රී ලංකාව සඳහා වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දීම

ලොව පුරා මහ බැංකු මුදල් ඉලක්කකරණ රාමුවලින් ඉවත්වීමේ ප්‍රවණතාව අනුව යමින්, ශ්‍රී ලංකා මහ බැංකුව ද සිය මුදල් ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කරමින් එය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් බවට පරිවර්තනය කිරීමට කටයුතු කරමින් සිටියි. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවකට මැදිකාලීන ව අනුගත වීමේ අරමුණින් ඒ සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පසුගිය වසර කිහිපය මුළුල්ලේ ම ශ්‍රී ලංකා මහ බැංකුව හා රජය කටයුතු කර ඇත. මුදල් සැපයුම හා උද්ධමනය අතර දුර්වල වෙමින් පවතින සම්බන්ධතාව ද ඇතුළු ව මුදල් සමස්ත ඉලක්කකරණ රාමුවෙහි දැකිය හැකි අනෙකුත් දුර්වලතා හේතුවෙන්

මෙම ක්‍රියාවලිය තවත් කඩිනම් වී ඇත. මුදල් ගුණකයේ හා සංසරණ ප්‍රවේගයේ උච්චාවචන ඉහළ යෑම මධ්‍යයේ, නාමික අතරමැදි විචල්‍යයක් ලෙස මුදල් ඉලක්කවල කාර්යභාරය අවිනිශ්චිත වී ඇති අතර එ මගින් මහ බැංකුවේ සන්නිවේදන උපායමාර්ග ද සංකීර්ණත්වයට පත් කර ඇත.

අන්තර්කාලීන පියවරක් ලෙස, මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය, මුදල් සමස්ත ඉලක්කකරණ සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ යන උපායමාර්ග දෙකෙහි ම ලක්‍ෂණ ඇති ව වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් (Enhanced Monetary Policy Framework) යටතේ ක්‍රියාත්මක කරයි. මෙම වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ, වර්ධන අරමුණුවලට සහ විනිමය අනුපාතික කළමනාකරණයේ නම්‍යශීලිත්වයට සහය දෙන අතර ම, මැදිකාලීන ව උද්ධමනය මැදි තනි අගයක පවත්වා ගැනීමට මහ බැංකුව අරමුණු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් සමස්ත සඳහා ඉලක්ක ප්‍රසිද්ධ නොකළ ද, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉවහල් වන අතරමැදි දර්ශක විචල්‍ය ලෙස පුළුල් මුදල් සමස්ත තවදුරටත් කටයුතු කරනු ඇත. තව ද, මේ වන විට මහ බැංකුව විසින් සිය මෙහෙයුම් ඉලක්කය ලෙස සංචිත මුදල් වෙනුවට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය භාවිත කරනු ලබන අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළෙඳපොළ කටයුතු වැනි වෙළෙඳපොළ මත පදනම් වූ ප්‍රතිපත්ති උපකරණ මත වැඩි වශයෙන් විශ්වාසය තබා ඇත. මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කෙටිකාලීන පුරෝකථන ආකෘති සහ මැදිකාලීන ගතික ආනුමානික පොදු සමතුලිතතා (Dynamic Stochastic General Equilibrium) ආකෘති යනාදිය භාවිත කරමින්, උද්ධමන පුරෝකථන ද ඇතුළු ව සාර්ව ආර්ථික පුරෝකථන වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු කරමින් සිටී. මිල සහ මූර්ත අංශයේ ස්ථායිතාව තිරසාර පදනමකින් පවත්වා ගැනීම සඳහා ආර්ථිකයේ ඉහළ යන අවශ්‍යතා සහ ගතික ගෝලීය පරිසරය අනුව යමින්, මුදල් ප්‍රතිපත්ති රාමුව තවදුරටත් නවීකරණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ඉදිරියේ දී කටයුතු කරනු ඇත. කෙ සේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය විධිමත් ලෙස හඳුන්වා දීමේ ක්‍රියාවලියේ දී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා රජයේ කැපවීම ද අත්‍යවශ්‍ය වේ.


මූලයන්:

Hammond, Gill (2012) "State of the Art of Inflation Targeting", Handbook – No. 29, Centre for Central Banking Studies, Bank of England

Report of the Expert Committee to Revise and Strengthen the Monetary Policy Framework, (2014), Reserve Bank of India

Roger, Scott (2010), "Inflation Targeting Turns 20", Finance & Development, International Monetary Fund

Svensson, Lars E.O. (2009), "Flexible Inflation Targeting – Lessons from the Financial Crisis", speech at the workshop "Towards a New Framework for Monetary Policy? Lessons from the Crisis", Netherlands Bank, Amsterdam

Svensson, Lars E.O. (2010), "Inflation Targeting", Handbook of Monetary Economics, Volume 3a and 3b


(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015)

# ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් පිළිබඳ සමීක්ෂණයේ ප්‍රධාන නිරීක්ෂණයන්


ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයන් සහ ශ්‍රී ලාංකික ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන් ලබාගන්නන්ගේ මූල්‍ය සාක්ෂරතාව හා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම යන මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් පිළිබඳ සමීක්ෂණයක් පවත්වනු ලැබී ය. පළාත් අටක් ආවරණය වන පරිදි අම්පාර, අනුරාධපුරය, බදුල්ල, ගම්පහ, හම්බන්තොට, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මන්නාරම, මාතලේ, මාතර, මොණරාගල, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක 15 අතුරින් ලංකා ක්ෂුද්‍ර මූල්‍ය නියුක්තිකයන්ගේ සංගමයේ ලියාපදිංචි වූ ආයතන සහ බැංකු නො වන මූල්‍ය ආයතනවලින් තෝරා ගත් ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රතිලාභීන් 1,588කගෙන් යුතු නියැදියක් මෙම සමීක්ෂණය සඳහා යොදා ගන්නා ලදී.

## සමීක්ෂණයේ නිරීක්ෂණයන්

### ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලාභීන්ගේ මූලික තොරතුරු


මුළු නියැදියෙන් සියයට 96ක් කාන්තාවන් වූ අතර බහුතරය අවුරුදු 31 සිට 40 දක්වා වයස් කාණ්ඩයට අයත් විය. මොවුන්ගේ අධ්‍යාපන මට්ටම සතුටුදායක තත්ත්වයක තිබූ අතර සියයට 64ක් ප්‍රතිලාභීන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) හෝ ඉන් ඉහළ අධ්‍යාපන තත්ත්වයක් ලබා තිබුණි. විධිමත් අධ්‍යාපනයක් නො ලැබූ ප්‍රතිලාභීන් සිටියේ සියයට එකක් වැනි සුළු ප්‍රතිශතයක් පමණි. ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රතිලාභීන් විසින් ලබා ගත් මුළු ණය සංඛ්‍යාව 4,274ක් වූ අතර ඒ අනුව එක් පුද්ගලයෙකු විසින් ලබා ගත් සාමාන්‍ය ණය ප්‍රමාණය ආසන්න වශයෙන් තුනක් විය.

**ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රතිලාභීන්ගේ අධ්‍යාපන තත්ත්වය**




මුළු නියැදියෙන් සියයට 84ක ප්‍රතිලාභීන් පිරිසක් කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශවලට අදාළ ව්‍යාපාර කටයුතුවල නියැලී තිබුණි. මෙම ව්‍යාපාර කටයුතු පළාත් අනුව සැලකීමේ දී කෘෂිකාර්මික අංශයට අදාළ ව්‍යාපාර වැඩි ම ප්‍රතිශතය උතුරු පළාතින් වාර්තා වූ අතර, කාර්මික හා සේවා අංශවලට අදාළ වැඩි ම ව්‍යාපාර ප්‍රතිශතය බස්නාහිර පළාතින් වාර්තා විය. මෙම ව්‍යාපාරවලින් වැඩි ප්‍රමාණයක් අවුරුදු 2ත් 6ත් අතර කාලයක් පවත්වා ගෙන යනු ලැබ තිබුණි. මෙම ප්‍රවණතාව ඌව පළාත හැර ඉතිරි සියලු ම පළාත්වලින් පිළිබිඹු වූ අතර, ඌව පළාතේ අවුරුදු 2ට අඩු, අවුරුදු 2 සිට 6 දක්වා සහ අවුරුදු 10 සිට 20 දක්වා යන කාලයන් තුළ පවත්වා ගෙන ගිය ව්‍යාපාර සමාන ප්‍රතිශතයන්ගෙන් වාර්තා වීම දිගු කාලයක් එක ම තත්ත්වයේ පවත්නා ව්‍යාපාර එම පළාතේ පවතින බව පෙන්නුම් කරන සාධකයක් විය හැකි ය.


**පළාත් අනුව ව්‍යාපාර පවත්වාගෙන ගිය කාල පරාසය වසරවලින් (X)**




## ණය පිළිබඳ තොරතුරු

ප්‍රතිලාභීන් විසින් ලබාගත් 4,274ක් වූ මුළු ණය ප්‍රමාණයෙන් බහුතරය (සියයට 44ක්) රුපියල් 25,000ත් රුපියල් 50,000ත් අතර වටිනාකමින් යුතු ඒවා විය. මෙම ණය ප්‍රමාණයෙන් සියයට 80ක් ව්‍යාපාර කටයුතු සඳහා ද, සියයට 18ක් පෞද්ගලික කටයුතු හා සියයට 2ක් වෙනත් ණය පියවීම ද යන අවශ්‍යතා සඳහා ලබාගෙන තිබුණි. ප්‍රතිලාභීන් විසින් ලබා දුන් තොරතුරු පදනම් කර ගෙන ගණනය කළ ණය පොලී අනුපාතිකයන් සැලකීමේ දී, ලබාගෙන තිබූ මුළු ණයවලින් අඩකට වඩා වැඩි ප්‍රමාණයක පොලී අනුපාතය සියයට 15ත් 35ත් අතර පරාසයේ වූ අතර, එයින් සියයට 30ක පොලී අනුපාතය සියයට 15ත් 25ත් අතර පරාසයේ ද තවත් සියයට 31ක ණය සඳහා අදාළ පොලී අනුපාතය සියයට 25ත් 35ත් අතර ද පැවතිණි.

**ගණනය කරන ලද පොලී අනුපාතික (X) ව්‍යාප්තිය**




ණය ලබා ගත් අවශ්‍යතාව අනුව ණය පියවීම සඳහා යොදා ගත් මූලාශ්‍රයන්ගේ කැපී පෙනෙන වෙනසක් පෙන්නුම් කළ අතර, ව්‍යාපාර ණයවලින් සියයට 58ක් පියවීම සඳහා ව්‍යාපාර ආදායම භාවිත කර ඇති අතර පෞද්ගලික කටයුතු සඳහා ලබා ගත් ණයවලින් සියයට 42ක් පියවීම සඳහා පවුලේ සාමාජිකයන්ගෙන් ලබා ගත් අරමුදල් භාවිත කර ඇත.

බැංකු නො වන මූල්‍ය ආයතන මගින් ලබා දුන් ණය වැඩි ප්‍රතිශතයක් අය කර ගැනීම සතිපතා සිදු කර ඇති අතර අනෙකුත් සියලු ම ආයතන ණය වාරික අය කර ගැනීම මාසික ව සිදු කර ඇත. ණය අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා බැංකු නො වන මූල්‍ය ආයතන මගින් අඩු කාලයක් ගෙන තිබූ අතර, ඔවුන්ගේ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 70ක් සති තුනකට වඩා අඩු කාලයක දී අනුමත කිරීමට සමත් ව තිබුණි. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා අනෙකුත් විධිමත් ආයතන[1] ණය අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සති 3කට වඩා දිගු කාලයක් ගෙන තිබුණි. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා අනෙකුත් විධිමත් ආයතනවලින් ලබා දී තිබූ වැඩි ණය ප්‍රමාණයක් සමග අනිවාර්ය ක්ෂුද්‍ර ඉතිරි කිරීමේ ගිණුමක් ලබා දී ඇති අතර ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා බැංකු නො වන මූල්‍ය ආයතන ඔවුන්ගේ ණය සඳහා අනිවාර්ය ක්ෂුද්‍ර රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී ඇත.

## මූල්‍ය සාක්ෂරතාව

මෙම සමීක්ෂණයේ දී ප්‍රතිලාභීන් සතු මූල්‍ය සාක්ෂරතාව මැනීම සඳහා, ණය තොරතුරු පිළිබඳ ඔවුන්ගේ දැනුම්වත්භාවය, බැංකු[2] හා අනෙකුත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මගින් ලබා දුන් පහසුකම් හා ඒ ආධාරයෙන් ප්‍රතිලාභ ලබා ගත් ආකාරය යන කාරණා පිළිබඳ ප්‍රතිලාභීන්ගේ දැනුම්වත්කම විමසා බලන ලදී. සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූවන් විසින් ලබා ගත් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 48ක ණය ප්‍රමාණයක් සඳහා පමණක් අදාළ පොලී අනුපාතික සඳහන් කිරීමට මොවුන්ට හැකි විය. කෙ සේ වෙතත්, මුළු ණය ප්‍රමාණයෙන් සියයට 95ක වාරික පිළිබඳ ව තොරතුරු පැවසීමට හෝ මෙම තොරතුරු ඇතුළත් ණය පොත් ඉදිරිපත් කිරීමට ප්‍රතිලාභීන් සමත් විය. බැංකු මගින් ණය ඉල්ලුම් නො කිරීම සඳහා බල පෑ හේතු විශ්ලේෂණය කිරීමේ දී, ප්‍රතිලාභීන්ගෙන් සැලකිය

1 සමූපකාර ග්‍රාමීය බැංකු, සමෘද්ධි බැංකුව, සණස සමිති යනාදිය

2 බැංකු යන්නෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු අදහස් කෙරේ


යුතු ප්‍රතිශතයක් (සියයට 7ක්) බැංකු මගින් ලබා දෙන පහසුකම් පිළිබඳ නො දැනුවත්කම ඒ සඳහා හේතු වූ බව සඳහන් කර තිබූ අතර ඒ හා සමාන ප්‍රතිශතයක් එ වැනි ආයතනයක් ආසන්නයේ නොමැතිකම මේ සඳහා හේතුවක් වශයෙන් දක්වා ඇත.

ප්‍රතිචාර දැක්වූවන් ලබා ගෙන ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 80ක් ව්‍යාපාරික කටයුතු සඳහා ලබා ගෙන ඇති අතර, එ සේ ලබා ගත් ව්‍යාපාරික ණයවලින් සියයට 38ක මුළු ණය මුදල ම ණය ලබා ගත් කාරණය සඳහා යෙද වූ බව සඳහන් කර තිබුණි. කෙ සේ වුවත් ව්‍යාපාරික ණයවලින් සියයට 16ක ප්‍රතිලාභීන් එම ණය මුදල යෙද වූ ආකාරය පිළිබඳ අදහසක් නොමැති බව සඳහන් කර තිබුණි. මෙම ණය ලබා ගැනීමෙන් අත්පත් කර ගත් ප්‍රතිලාභ පිළිබඳ සැලකීමේ දී ව්‍යාපාර ණයලාභීන්ගෙන් සියයට 42ක් ණය ලබා ගැනීම මගින් තම ආදායම වැඩිදියුණු කර ගැනීමට හැකි වූ බව සඳහන් කර තිබූ අතර තවත් සියයට 17ක ප්‍රමාණයක් බලාපොරොත්තු වූ පරිදි ව්‍යාපාර දියුණු කර ගැනීමට නො හැකි වූ බව හෝ ව්‍යාපාරය පෙර තිබූ තත්ත්වයටත් වඩා පහත වැටුණු බව සඳහන් කර ඇත.

### සමීක්ෂණයේ නිගමන

සමීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව ක්ෂුද්‍ර මූල්‍ය ණය බහුතර ප්‍රමාණයක් ලබා දී ඇත්තේ කාන්තාවන් සඳහා ය. මෙම සමීක්ෂණයේ දී බැංකු ගිණුම් හිමි ප්‍රතිලාභීන්ගේ ප්‍රතිශතය හා එ මගින් ගනුදෙනු කරන ලද වාර ගණන ඉහළ අගයන් පෙන්නුම් කළ අතර එ මගින් ප්‍රතිලාභීන්ගේ මූල්‍ය අන්තර්ගතභාවය සතුටුදායක මට්ටමක පවතින බවට නිගමනය කරන ලදී. මූල්‍ය සාක්ෂරතාව සැලකීමේ දී අඩකට වඩා වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයක් ණය පොලී අනුපාතික පිළිබඳ දැනුම්වත් වී සිටි අතර ප්‍රතිලාභීන්ගෙන් සියයට 95ක් ණය වාරික හෝ ණය තොරතුරු සම්බන්ධ ලියකියවිලි ලබා දීමට සමත් විය. බහුතර ණය ප්‍රමාණයක් ව්‍යාපාර කටයුතු සඳහා ලබා ගෙන ඇති අතර එ මගින් තම ව්‍යාපාරවල ආදායම/ලාභය වැඩි කර ගැනීමට සමත් වූ ප්‍රතිලාභීන් මෙන් ම ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලැබුණ ද ව්‍යාපාරය කිසිසේත් ම දියුණු කර ගැනීමට නො හැකි වූ ප්‍රතිලාභීන් සැලකිය යුතු ප්‍රමාණයක් පිළිබඳ තොරතුරු ද මෙම සමීක්ෂණයෙන් වාර්තා විය. බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන මගින් ලබා දුන් ණය පිළිබඳ විමසා බැලීමේ දී ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩි ප්‍රමාණයක් බැංකු නො වන මූල්‍ය ආයතනවලින් ලබා දී ඇති අතර ඉහළ වටිනාකමකින් යුතු ණය වැඩි ප්‍රමාණයක් ලබා දී ඇත්තේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු මගිනි. එක් පුද්ගලයෙකු විසින් ලබා ගෙන ඇති සාමාන්‍ය ණය සංඛ්‍යාව තුනක් වූ අතර මුළු ණයවලින් වැඩි ප්‍රමාණයක් රු.25,000ත් රු.50,000ත් අතර පරාසයක විය. බහුතරයක් ණය සඳහා අය කර ඇති පොලී අනුපාතය සියයට 25ත් 35ත් අතර පරාසයේ වූ අතර මෙම පොලී අනුපාතය ප්‍රධාන වශයෙන් අය කර ඇත්තේ බැංකු නො වන මූල්‍ය ආයතන හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලිනි. එ මෙන් ම බැංකු ණය අඩු පොලී මට්ටමකට ලබා දීමේ ප්‍රවණතාවක් ද දක්නට ලැබුණි. බැංකු නො වන මූල්‍ය ආයතන හා අනෙකුත් ණය ලබා දෙන්නන් (පොලීකරුවන්, ඥාතීන් යනාදිය) මගින් ලබා දුන් ණය ඉතා අඩු කාලයක් තුළ දී ලබා දී තිබුණි. සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව බැංකු මගින් ණය ලබා ගැනීම හෝ නො ගැනීම සඳහා ඇප සම්බන්ධයෙන් ඇති ගැටලු සහ දිගු හා අසීරු අයදුම්පත් ක්‍රියාවලි යන කරුණු හේතු වී ඇත.

**ව්‍යාපාරික ණය ප්‍රතිලාභ**




(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015)

# විදුලිබල උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති

**හැඳින්වීම**

පුනර්ජනනීය බලශක්තීන්වල[1] ඇති තිරසාරත්වය, ආර්ථික ප්‍රතිලාභ සහ විශේෂයෙන් ම ඒ මගින් පරිසරය මත වන අඩු අයහපත් බලපෑම අවබෝධ කර ගනිමින් පසුගිය දශක කිහිපය පුරා සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල පුනර්ජනීනය බලශක්තීන් භාවිත කිරීම වර්ධනය කිරීමේ ඉහළ නැඹුරුවක් දක්නට විය. මේ නිසා, ලෝකයේ මුළු විදුලිබල උත්පාදනයෙන් පුනර්ජනනීය බලශක්තීන්ගේ දායකත්වය 2005 වසරේ දී වාර්තා කළ සියයට 19.4ට සාපේක්ෂව 2014 වසරේ දී 23.6ක් දක්වා ඉහළ ගොස් ඇත.

**පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ ප්‍රතිලාභ**

පුනර්ජනනීය බලශක්ති එහි ආවේණික ස්වභාවය තුළින් ම තිරසාරත්වය, අනාගත කාලගුණික ආරක්ෂිතභාවය, ආර්ථික වර්ධනය ඉහළ නැංවීම, නව රැකියා නිර්මාණය කිරීම සහ මානව සුභ සාධන වර්ධනය කිරීම ආදී විවිධාකාර ප්‍රතිලාභ ලබා දෙයි. මෙම පුනර්ජනනීය බලශක්ති මගින් ගෝලීය බලශක්ති සංකලනය කාබන්හරණය කිරීම තුළින් ගෝලීය කාබන් වර්ධනය අඩු කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පසුගිය දශක කිහිපය තුළ, ලොව පුරා ජීවන තත්ත්ව ඉහළ යෑම හේතුවෙන් විදුලිය උත්පාදනය සඳහා ඇති ගෝලීය ඉල්ලුම ජනගහන වර්ධනයට වඩා වැඩි වේගයකින් ඉහළ ගොස් ඇත. මෙම වැඩි වන ඉල්ලුමෙන් විශාල කොටසක් පරිසරයට හානිකර පොසිල ඉන්ධන දහනය හරහා සපුරා ගැනිණි. ඒ නිසා, හරිතාගාර වායු විමෝචන අඩු කිරීමට ලෝක මට්ටමේ උත්සාහයන් දිරිමත් කරමින් වායුගෝලීය හරිතාගාර වායු සාන්ද්‍රණය වැඩි වීම මගින් දේශගුණික විපර්යාස වීමට ඇති තර්ජනය පිළිබඳ ව වර්ධනය වන සම්මුතියක් පවතී. ගල්අඟුරු, තෙල් හා ස්වාභාවික වායු මගින් බලශක්ති උත්පාදනය තුළින් විමෝචනය වන සාමාන්‍ය කාබන්ඩයොක්සයිඩ් තීව්‍රතාව, පිළිවෙළින්, කිලෝවොට් පැයකට ග්‍රෑම් 960, 800 සහ 450 වන අතර පුනර්ජනනීය බලශක්තීන් මගින් කාබන්ඩයොක්සයිඩ් විමෝචනය නො කෙරේ[2]. ලොව පුරා ආර්ථිකයන්ගේ ආර්ථික වර්ධනය කාබන්හරණය තුළින් අත්කර ගැනීම සහතික කරමින්, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවල හත්වන ඉලක්කය තුළින් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය අවධාරණය කරයි. පුනර්ජනනීය බලශක්තීන්ගේ දායකත්වය වැඩි කිරීම තුළින් කාබන්ඩයොක්සයිඩ් විමෝචනය සැලකිය යුතු ලෙස අවම කරන අතර, ඒ මගින් ගෝලීය උෂ්ණත්වය ඉහළ නැගීම අවම කරමින් විනාශකාරී දේශගුණික විපර්යාස ඇතිවීම වළක්වනු ඇත.

තිරසාර සංවර්ධනය සහ බලශක්ති සුරක්ෂිතභාවය පිළිබඳ සන්දර්භය තුළ පුනර්ජනනීය බලශක්තීන්වල භූමිකාව වඩාත් වැදගත් බවට පත් වී ඇත. 2030 වසර වන විට ගෝලීය බලශක්ති සංකලනයේ පුනර්ජනනීය බලශක්තිවල දායකත්වය දෙගුණ කර ගැනීම තුළින් ගෝලීය දළ දේශීය නිෂ්පාදිතය අවසන් උපයෝජනයන්හි ඉහළ අනුපාතයක් විදුලිය භාවිතයෙන් සිදු කර ගැනීම ද උපකාරී කර ගනිමින් සියයට 1.1කින් වැඩි කරන බව අනතර්ජාතික පුනර්ජනනීය බලශක්ති ආයතනය (IRENA) පුරෝකථනය කරයි. රටෙහි බලශක්ති සුරක්ෂිතභාවය ද ඉහළ නංවන දේශීය මූලාශ්‍ර මත වැඩි වශයෙන් රඳා පවතින පුනර්ජනනීය බලශක්ති උත්පාදනය දිරිගැන්වීම තුළින් තෙල් ආනයනය කරන රටවල ආර්ථිකයන් මත යහපත් රැළිති බලපෑම් (Ripple Effects) ඇති කරමින් වෙළඳ ශේෂයන් වැඩි දියුණු කර ගැනීමට උපකාරී වන අතර දේශීය අගය එකතු කිරීම හා රැකියා අවස්ථා ද නිර්මාණය කරයි. පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය හරහා පොසිල ඉන්ධන තාක්ෂණයන්ට වඩා වැඩි රැකියා අවස්ථා නිර්මාණය කරන අතර ඒ මගින් ඉහළ කුසලතාවලින් යුත් ශ්‍රම බලකාය සඳහා පමණක් නො ව ප්‍රජාව පදනම් කරගත් ප්‍රවේශයන් හරහා අඩු ආදායම්ලාභී පවුල් සඳහා ද රැකියා අවස්ථා උදා කරයි. උදාහරණයක් ලෙස, ගල්අඟුරු හෝ ස්වාභාවික වායු බලශක්තීන්ට සාපේක්ෂ ව සූර්ය

1 පුනර්ජනනීය බලශක්ති යනු හිරු එළිය, සුළං, වැසි, වඩදිය බාදිය තරංග හා භූ තාපය වැනි මානව කාලපරිච්ඡේදයක් තුළ ස්වාභාවිකව ම සකස්වන ලෙස සම්පත්වලින් උපදවන ශක්ති ආකාරයකි.

2 දහනයේ දී විමෝචනය වන කාබන්ඩයොක්සයිඩ් ශාක නැවත වැඩීමේ දී නැවත උරා ගන්න බැවින්, ශුද්ධ පදනමින් ගත් විට ජෛව ස්කන්ධ හරහා විදුලිබල උත්පාදනයේ දි කාබන්ඩයොක්සයිඩ් විමෝචනය ශුන්‍ය වේ.


ප්‍රකාශ වෝල්ටීයතා බලශක්ති හරහා දෙගුණයකින් රැකියා අවස්ථා නිර්මාණය කරයි. එ වැනි බොහෝ රැකියා නිර්මාණය වනුයේ දැව වැනි ඉන්ධන සැපයීම තුළින් සහ අගය එකතු කළ දේශීය තාක්ෂණය හරහා උපකරණ සවි කිරීම හා නිෂ්පාදනය කිරීම තුළිනි. තව ද, පුනර්ජනනීය තාක්ෂණය අඩු සම්ප්‍රේෂණ හානි වීමක් ඇති ව විදුලිබල පද්ධතියට සම්බන්ධිත නො වූ විදුලිබල සේවාවන් ලබාදීමට ඇති හැකියාව හේතුවෙන් ඒවා ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවලට විදුලිබලය ලබාදීම සඳහා වඩාත් ගැලපෙන අතර එමගින් ඵලදායි භාවිතයන් ප්‍රවර්ධනය, අධ්‍යාපනයට පෙළඹවීම, නවීන සන්නිවේදන තාක්ෂණයන්ට ප්‍රවේශය ඇති කිරීම හා නව ආර්ථික අවස්ථා රැසක් නිර්මාණය කිරීම තුළින් ග්‍රාමීය සංවර්ධනයට පහසුකම් සලසමින් දිළිඳුකම අවම කරයි.

## විදුලිබල උත්පාදනයේ සංයුතිය සහ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාව තුළ විදුලිබල උත්පාදනය 1990 වසර අග දක්වා මූලික වශයෙන් ජල විදුලිය හරහා සිදුවිය. කෙසේ

1 වන රූප සටහන


**ස්ථාපිත ධාරිතාව**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

2 වන රූප සටහන

**විදුලිබල උත්පාදනය**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

වුව ද, ආර්ථික වර්ධනය සහ වැඩි වන විදුලිබලය සඳහා වන ප්‍රවේශයට අනුකූල ව විදුලිබලය සඳහා වන ඉල්ලුම වැඩි වීම හේතුවෙන් 1980 දශකයේ මුල් භාගයේ සිට තාප විදුලි බලාගාර ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලදී[3]. 2015 අවසන් වන විට, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල විදුලිබල ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 1,377 වූ අතර ඉන්ධන තෙල්, ගල්අඟුරු සහ සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය බලශක්ති ස්ථාපිත ධාරිතාවයන් පිළිවෙළින් මෙගාවොට් 1,115, මෙගාවොට් 900 සහ මෙගාවොට් 458ක් වූහ. සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන්, මෙගාවොට් 306.7ක කුඩා ජල විදුලිබලයකින්, මෙගාවොට් 126.9ක සුළං බලයකින්, මෙගාවොට් 13.1ක ජෛව ස්කන්ධ බලයකින්, මෙගාවොට් 10.5ක ඩෙන්ඩ්‍රෝ[4] බලයකින් සහ මෙගාවොට් 1.4ක සූර්ය බලයකින් සමන්විත වේ.

ශ්‍රී ලංකාව දැනටමත් එහි ප්‍රධාන ජල විදුලිබල විභවයන් සංවර්ධනය කර ඇති අතර, ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රධාන ව්‍යාපෘති හරහා මෙගාවොට් 186ක වැඩි ධාරිතාවක් පමණක් පද්ධතියට එකතු කළ හැකි වනු ඇත. ඒ නිසා, වර්තමානයේ ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය බලශක්තීන් පිළිබඳ අවධානය යොමු කර ඇත. 2015 වසර වන විට සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය බලශක්තීන් හරහා සමස්ත විදුලිබල උත්පාදනයෙන් සියයට 10ක් උත්පාදනය කිරීමේ ජාතික බලශක්ති ප්‍රතිපත්තියෙහි පළමු ඉලක්කය, එම මූලික ප්‍රතිපත්ති සකස් කළ 2006 වසරේ දී වාර්තා කළ සියයට 3.7ට සාපේක්ෂ ව මේ වනවිට සාර්ථක ලෙස සියයට 11.2ක දායකත්වයක් දක්වා එය ළඟා වී ඇත. පසුව, එම ඉලක්කය, 2020 වසර වන විට සියයට 20ක දායකත්වයක් ළඟා කර ගැනීම සඳහා සංශෝධනය කරන ලදී. මෑතක දී රජය විසින් සකස් කළ දැනුම මත පදනම් ආර්ථිකය සඳහා ශ්‍රී ලංකා බලශක්ති අංශයේ සංවර්ධන සැලැස්ම: 2015-2025 මගින් පුනර්ජනනීය බලශක්තීන්ගේ පූර්ණ විභවය සහ අනෙකුත් දේශීය සම්පත් දියුණු කිරීම හරහා 2030 වසර වන විට බලශක්තීන්ගෙන් ස්වයංපෝෂිත ජාතියක් බවට පත් වීමට අපේක්ෂා කෙරේ. 2013 දී සියයට 3ක් වූ පුනර්ජනනීය බලශක්තීන්ගේ ප්‍රාථමික ශක්ති සැපයුමේ දායකත්වය[5] 2030 වසර වන විට සියයට 34ක් දක්වා වැඩි කිරීම, පුනර්ජනනීය බලශක්තීන්ගේ විදුලිය උත්පාදනය සඳහා වන දායකත්වය 2020 වසර වන විට සියයට 60ක් දක්වා වැඩි කිරීම, ජෛව ස්කන්ධ විදුලිබල උත්පාදනය වැඩි කිරීම සහ 2025 වන විට බලශක්ති අංශයේ කාබන් විමෝචනය සියයට 5කින් අඩු කිරීම වැනි

3 යාපනය අර්ධද්වීපයට විදුලිබලය සැපයීම සඳහා චුන්නාකම් තාප විදුලිබලාගාරය 1958 වසරේ දී ස්ථාපනය කළ ද 1973 වන තෙක් යාපනය අර්ධද්වීපය ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ වී නොතිබුණි.

4 ඩෙන්ඩ්‍රෝ විදුලිබලය යනු තිරසාරව වවනු ලබන ජෛව ස්කන්ධ හරහා උත්පාදනය කරන විදුලිබලය වේ.


5 ජල විදුලිය හා දැව ඉන්ධන ලෙස භාවිතා කරන ජෛව ස්කන්ධ හැර

ඉලක්ක කිහිපයක් මෙම සැලැස්ම මගින් ඉදිරිපත් කර ඇත. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය බලශක්ති අංශය 2030 වසර වන විට කුඩා ජල විදුලි බලාගාර මගින් නිපදවන විදුලිය මෙගාවොට් 873, සුළං බලය මෙගාවොට් 401, සූර්ය බලශක්ති මෙගාවොට් 161 සහ ජෛව ස්කන්ධ බලය මෙගාවොට් 153ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

## සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය බලශක්ති අංශයේ සංවර්ධනය සඳහා පවතින අවස්ථා

2015 වසර වන විට ශ්‍රී ලංකාව විසින් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ පළමු වැදගත් සංධිස්ථානය ලෙස සමස්ථ විදුලිබල උත්පාදනයෙන් සියයට 10ක් නිපදවීමේ ඉලක්කය අත් කර ගෙන ඇත. කෙ සේ වෙතත්, සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය බලශක්තීන්ගේ මුළු ධාරිතාවයෙහි කුඩා ජලවිදුලි බලාගාරවල දායකත්වය සියයට 66.9ක් වන හෙයින් ඒ හරහා විදුලිබල උත්පාදනය රටේ කාලගුණික තත්ත්වය මත රඳා පවතී. ඒ නිසා, විදුලිබල ඉල්ලුමේ අපේක්ෂිත ඉහළ වර්ධනය මගින් විශාල අභියෝගයක් ඇති වුව ද, සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය බලශක්ති අංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා රටේ ස්වාභාවික උරුමයක් ලෙස පවතින සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය බලශක්ති සම්පත් නෙලා ගැනීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව විසින් දැනටමත් සියලු ප්‍රධාන ජල සම්පත් උපයෝගී කරගෙන ඇති නමුත්, තවමත් ජල වාහක ව්‍යුහයන්, විශේෂයෙන් කුඩා පරිමාණ ටර්බයින භාවිතයෙන් විදුලිබලය නිපදවීම වැඩි වශයෙන් භාවිත නො කරන අතර වාරිමාර්ග ජාලයේ පවතින ජල විදුලිබලය නිපදවීමේ විභවය උකහා ගැනීමට ද බොහෝ දුරට උත්සාහ ගෙන නොමැත. තව ද, විශේෂයෙන් ම, මන්නාරම, පුත්තලම සහ යාපනය යන ප්‍රදේශවල ගිගාවොට් 1කට වඩා වැඩි සුළං බල විභවයක් ඇති බව

**සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ස්ථාපිත ධාරිතාව**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

හඳුනාගෙන ඇත. විදුලිබල කර්මාන්තය විසින් අති මහත් වූ ජෛව ස්කන්ධ සම්පත් බොහෝ දුරට ප්‍රයෝජනයට ගෙන නොමැති අතර කෘෂිකාර්මික අපද්‍රව්‍ය හා නාගරික ඝන අපද්‍රව්‍ය මගින් සැලකිය යුතු විදුලි බලශක්ති ප්‍රමාණයක් උත්පාදනය කිරීමට විභවයක් ඇත. නිවර්තන කලාපීය රටක් වීම සහ අනෙකුත් විකල්ප පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ට සාපේක්ෂ ව පරිමාණය හා ප්‍රවේශය අතින් සූර්යබල ශක්තිය ඉහළ මට්ටමක පැවැතීම යන කරුණු සැලකීමේ දී සූර්ය බලශක්තිය රටට වඩාත් සුදුසු පුනර්ජනනීය බලශක්තියකි.

## සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය බලශක්ති අංශයේ සංවර්ධනයේ දී මුහුණ පාන අභියෝග

ශ්‍රී ලංකාව විවිධාකාර පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් අනූන වුවත්, තාක්ෂණික-ආර්ථික විවිධ ගැටලු පැවතීම හේතුවෙන් මෙම සම්පත් කාර්යක්ෂම භාවිතය අභියෝගයක් වේ. පොසිල ඉන්ධන හා අනෙකුත් සීමිත සම්පත් හා සසඳන විට පුනර්ජනනීය බලශක්තීන් අතිවිශාල ප්‍රදේශයක් පුරා විසිර ඇත. ඒ නිසා, එ වැනි විසිරී පවතින සම්පත් ඒකාබද්ධ කිරීමට විදුලිබල පද්ධතියේ පවතින බාධක පුනර්ජනනීය බලශක්තීන් සංවර්ධනය සඳහා දැඩි අවහිරතාවක් ලෙස පවතී. මෙ මගින්, එම සම්පත් සාර්ථක ලෙස භාවිත කිරීම සඳහා කාර්යක්ෂම ලෙස සම්පත් එකතු කිරීමේ යාන්ත්‍රණයක අවශ්‍යතාව පිළිබඳ ගැටලු මතු කරයි. තව ද, සම්ප්‍රේෂණ ජාලයෙහි පවතින සීමාවන් මගින් පද්ධතියට සම්බන්ධ කළ හැකි පුනර්ජනනීය බලශක්ති බලාගාර ප්‍රමාණය සීමා කරයි. බොහෝ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව කාර්මික නො වන ප්‍රදේශවල පිහිටා ඇති හෙයින් පුනර්ජනනීය බලශක්තීන් නිපදවන ස්ථානය හා සැපයුම් පද්ධතිය අතර දිගු සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම විශාල ගැටලුවකි. තව ද, බලශක්ති ගබඩා කිරීමේ විසඳුම් මෙතෙක් වාණිජමය යථාර්ථයන් බවට පත් වී නොමැති බැවින් බොහෝ විට පුනර්ජනනීය බලශක්ති ගබඩා කළ නො හැකි බලශක්ති දාමවලට සීමා වී ඇත. මෙ මගින් සැලසුම් නො කළ විදුලිබල අවශ්‍යතාව සම්බන්ධ සීමා හා යම් අවස්ථාවක දී තනි මූලාශ්‍රයකින් ලබාගත හැකි බලශක්ති ප්‍රමාණය සම්බන්ධ සීමාවන් නිර්ණය කරන පද්ධති මෙහෙයුම් මාර්ගෝපදේශ ඉටු කරගැනීමේ ගැටළු මතු කරයි.

අධික වියදම් දරා විසඳුම් දීමට සිදුවන ඉහත සඳහන් තාක්ෂණික බාධකයන්ට අමතර ව, අනිකුත් විදුලි ප්‍රභවවලට සාපේක්ෂ ව පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ බොහෝ වියදම් එහි ආරම්භයේ දී ම යෙදවීමට සිදුවන බැවින් පුනර්ජනනීය බලශක්තීන් ඉහළ මූලික වියදම්වලින් යුක්ත වන අතර එ නිසා ඒවායේ මිල ගණන් වෙළෙඳපොළ බලශක්තීන්ට වඩා ඉහළ මිලක් ගනී. මෙ මගින්, ප්‍රතිපත්ති සම්පාදකයින් හට සම්ප්‍රදායික නො වන පුනර්ජනනීය

බලශක්තීන්ගේ වේගවත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගැටලු මතු කරයි. සුළං හා සූර්ය වැනි බොහෝ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් තවමත් ඔවුන්ගේ කාර්යක්ෂම පරිමාණ සඳහා සංවර්ධනය වෙමින් පවතී. පොසිල ඉන්ධන සමඟ තරගකාරී වන ජෛව ස්කන්ධ/ඩෙන්ඩ්‍රෝ බලය සලකා බැලීමේ දී, ඒ සඳහා පාරිසරික සීමාවන් මතු කරවන ඉහළ සිසිලන ජල අවශ්‍යතාවක් පවතින අතර ඉන්ධන රැස් කිරීම, ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම ද ගැටලු සහගත ය.

## ඉදිරි ක්‍රියාමාර්ග

පසුගිය වසර කිහිපය පුරා, පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයෙහි වඩාත් ශක්තිමත් සහ කාර්යක්ෂම වර්ධනයක් වී තිබේ. ශක්ති ගබඩා තාක්ෂණය වේගයෙන් සංවර්ධනය වෙමින් පවතී. 2008 වසරේ සිට ප්‍රකාශ වෝල්ටීයතා සූර්ය මිල සියයට 80කින් පහත වැටී ඇති අතර, එය දිගට ම පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සුළං විදුලිබලය ලාභදායී ම නව විදුලි ප්‍රභවය බවට පත් කරමින්, එහි මිල ගණන් 2008 වසරේ සිට සියයට 30කට ආසන්න ප්‍රමාණයකින් පහත වැටී ඇත. මෙම වර්ධනයන් විසින් ගෝලීය වශයෙන් පුනර්ජනනීය බලශක්තීන් වඩාත් ආකර්ෂණීය කර ඇත. මේ නිසා, ප්‍රතිපත්ති සම්පාදකයින් හට පුනර්ජනනීය බලශක්ති සඳහා හොඳ ම මූල්‍ය ක්‍රම සහ ඒවා සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ක්‍රමවේද සොයා ගැනීමේ වැදගත් කාර්යභාරයක් පැවරී ඇත. මන්නාරම මහා පරිමාණ සුළං කලාපය සහ පුළුල් ව්‍යාප්ත දැව ඉන්ධන උපයෝගී කර ගනිමින් සුදුසු ලෙස ස්ථානගත කළ මහා පරිමාණ ජෛව ස්කන්ධ/ඩෙන්ඩ්‍රෝ වැනි පුනර්ජනනීය බලශක්ති මහා පරිමාණ ලෙස සංවර්ධනය කිරීම ඉතා වැදගත් වේ. දැනටමත් ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්ති ආයෝජන පිළිබඳ ව ඉතා දිගු සාර්ථකත්වයක් ලබා ඇති බැවින්, මූල්‍ය ආයතන විසින් දීර්ඝකාලීන හා අඩු වියදම් මූල්‍යයන් ලබාදීමට උපකාර වනු ඇති අතර ජාතික බලශක්ති සංකලනයේ වඩා විශාල දායකත්වයක් සපුරා ගැනීම සඳහා පුනර්ජනනීය බලශක්තීන් පුළුල් කිරීමට දිගුකාලීන ව කැපවීමක් තිබේ නම්, වැඩි වශයෙන් ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට ද හැකි වනු ඇත. තව ද, ජාත්‍යන්තර සහයෝගය හා මූල්‍ය ප්‍රවාහයන් ආකර්ෂණය කර ගැනීම ද මෙහි දී ප්‍රධාන භූමිකාවක් ඉටු කරනු ඇති අතර ඒ අනුව වඩාත් විවාදයට තුඩු දී ඇති පුනර්ජනනීය බලශක්තීන් සංවර්ධනයේ දී ඉහළ මූලික වියදම දැරීමට සිදුවීම හා සම්බන්ධ ගැටලුවට පිළිතුරු සපයනු ඇත. පුනර්ජනනීය බලශක්ති සඳහා ඇති ඉල්ලුම තිරසාර හා පුළුල් වන විට තාක්ෂණය දියුණුවීමේ උපකාරය ද ලබමින් ක්‍රමයෙන් ආරම්භක පිරිවැය අඩු කර ගැනීමට පුනර්ජනනීය බලශක්ති කර්මාන්තයට හැකි වනු ඇත. තරගකාරී පුනර්ජනනීය සම්පත් තෝරා ගැනීම පාරිසරික හා මානව සෞඛ්‍ය වැනි බාහිර සාධක ද ඇතුළත් දීර්ඝකාලීන ආර්ථික පිරිවැය විශ්ලේෂණය කිරීම් මත පදනම් විය යුතු අතර එහි මිල ප්‍රතිපත්තිය, පිරිවැය පිළිබිඹු කරන නිරන්තර සංශෝධන සඳහා විධිවිධාන, තරගකාරී ලංසු කිරීම හා අවස්ථා පදනම් කරගත් ඇගයීම් හරහා ආයෝජකයන් අතර තරගකාරීත්වය වැඩි දියුණු කිරීම හා ඉහළ පිරිවැය ඉන්ධන තෙල් විදුලි උත්පාදනය ක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය යනාදිය ද සමඟ තවදුරටත් ශක්තිමත් කළ යුතු ය.

පුනර්ජනනීය බලශක්තීන්වල ඇති කඩින් කඩ විසිරුණු ස්වභාවය මගින් මතුවන ගැටලුව විසඳීම සඳහා විදුලි පද්ධතියෙන් පරිබාහිර ව ක්‍රියාත්මක කළ හැකි නව්‍ය ක්‍රමවේද හඳුනාගැනීම සහ පුළුල් ලෙස ව්‍යාප්ත විදුලි යටිතල පහසුකම්වල උපකාරයෙන් ක්ෂුද්‍ර ව්‍යාප්ති ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. විදුලිබල පද්ධතියේ හා සම්ප්‍රේෂණ ජාලයේ මතුවන බාධකවලට විසඳුම් ලබාදීම පැහැදිලි ව ම සංකීර්ණ හා කාලය වැය වන සැලසුම් හා ක්‍රියාත්මක කිරීම්වලින් සමන්විත වේ. කෙ සේ වෙතත්, සියලු අදාළ ආයතන හා ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේ සහාය ලැබෙන නොසැලෙන ප්‍රතිපත්ති කැපවීම් මගින් මෙම ගැටලුව ජය ගත හැකි වනු ඇත. ආයතන සහ අධිකාරීන්ගේ ක්‍රියාකලාපය ජාතික ප්‍රතිපත්තිය හා නොගැලපීම හේතුවෙන් වර්තමානයේ ගැටලුවලට මුහුණ පා ඇති පෞද්ගලික අංශය, මෙ වැනි ප්‍රතිපත්ති ඒකාබද්ධතාවක් හරහා ආයෝජනයට පෙළඹෙනු ඇති අතර පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ ක්‍රියා පටිපාටිය ද සුමට කරනු ඇත. එ වැනි සියලු පිරිවර මගින් තාක්ෂණික-ආර්ථික බාධක ජය ගැනීමට පහසුකම් සලසනු ඇති අතර රටේ සියලු පාර්ශ්වකරුවන්ට පුනර්ජනනීය බලශක්ති විසින් ලබා දෙන විශාල පරාසයක ඇති මැදි හා දිගුකාලීන ප්‍රතිලාභ ළඟා කරගත හැකි වනු ඇත.■


මූලාශ්‍ර :

IRENA Publications - http://www.irena.org/Publications/
- Renewable Energy Benefits: Measuring the Economics
- Rethinking Energy (2014,2015)

Ministry of Power and Renewable Energty, Sri Lanka-
Sri Lanka Energy Sector Development Plan for a
Knowledge-based Economy: 2015-2025

Worlwide electricity production - http://www.tsp-data-portal.org Breakdown-of-Electricity-generation-by-Energy-Source#tspQvChart

Sri Lanka Sustainable Renewable Energy Authority,
Renewable Energy Resource Development Plan 1/2012

Ceylon Electricity Board, Grid Network, http://www.ceb.lk/sub/other/knowledge-center/#tab-1442494789429-6-6


(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015)

# බැංකුවල සුරක්ෂිතභාවය සහ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා හඳුන්වා දෙන ලද නව නියාමන සහ අධීක්ෂණ ක්‍රමවේද

## 1. හැඳින්වීම

බැංකු නියාමන අධිකාරීන් නියාමනය සහ අධීක්ෂණය හරහා බැංකුවල සහ බැංකු පද්ධතියෙහි සුරක්ෂිතභාවය සහ ශක්තිමත්භාවය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබයි. ආර්ථික වශයෙන් සමෘද්ධිමත් කාලපරිච්ඡේදයන්හි දී අවදානම් සහ සංකේන්ද්‍රණයවීම් ගොඩනැගීමත්, ආර්ථික වර්ධනය අඩාල වන කාල පරිච්ඡේදයන්හි දී එ වැනි ගොඩනැගීම්වලින් පසුකාලීන ව පැන නැගිය හැකි ප්‍රතිඵලත් සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාව, ලෝක මූල්‍ය අර්බුදයෙන් සහ පසුකාලීන යුරෝපීය අර්බුදයෙන් පසු ව වඩාත් අවධාරණය කෙරිණි. මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළවල් සහ මූර්ත ආර්ථිකය අතර ඇති අන්තර් සම්බන්ධතා හේතුවෙන් එ වැනි ප්‍රතිඵලවල බලපෑම් තීව්‍ර විය. වෙළෙඳපොළ අධීක්ෂණයට හෝ සූක්ෂ්ම විචක්ෂණශීලී අධීක්ෂණයට හෝ, අධික ලෙස අවදානම් භාර ගැනීම හෝ මූල්‍ය ආයතන සහ වෙළෙඳපොළ ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන අන්තර් සම්බන්ධතා හෝ පාලනය කිරීමට නො හැකි විය. වෙන් වෙන් ව පවතින නියාමන ව්‍යුහයන්, අන්තර්ජාතික සහ දේශීය වශයෙන් තොරතුරු හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් පවතින නීතිමය බාධා සහ නියාමන ව්‍යුහයෙහි පවතින විෂමතා තුළින් පැන නගින ගැටලු මේ සඳහා බලපාන ලදී. නව බැංකු ව්‍යාපාර ආකෘතීන් හඳුන්වාදීමෙන් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විශාල ලෙස භාවිතයට ගැනීම හේතුවෙන් ද නියාමන අභියෝග වර්ධනය වී ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, රටවල් වැඩි වශයෙන්, සාර්ව විචක්ෂණශීලී අධීක්ෂණය, ව්‍යාපාර ආකෘති මත පදනම් වූ අවදානම් කෙරෙහි සංවේදී සහ අනාගතවාදී නියාමනයන් සහ අධීක්ෂණ ක්‍රමවේදයන්, අර්බුදවලට සූදානම්වීම සහ නිවාරණ සැලසුම් ශක්තිමත් කිරීම පිළිබඳ ක්‍රියාමාර්ග සහ අධීක්ෂණ සහයෝගිතාව පිළිබඳ ක්‍රියාමාර්ග හඳුන්වා දෙමින් සිටී.

## 2. සූක්ෂ්ම විචක්ෂණශීලී අධීක්ෂණයෙහි සිට සාර්ව විචක්ෂණශීලී ප්‍රවේශයක් වෙත යොමුවීම

### (අ) මූල්‍ය පද්ධතියෙහි පවතින පද්ධතිමය අවදානම්වලට පිළියම් සෙවීම

තනි තනි මූල්‍ය ආයතනවල අවදානම් සහ අනාවරණය වීම්වලට අමතර ව, මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළවල්, මූල්‍ය යටිතල ව්‍යුහයන් සහ මූර්ත ආර්ථිකය අතර ඇති අන්තර් සම්බන්ධතා හේතුවෙන් ද මූල්‍ය පද්ධතිය තුළ අසමතුලිතතා සහ සංකේන්ද්‍රණය වීම් ගොඩනැගිය හැකි ය. එම නිසා, අවදානම් පැතිර යෑම නිසා ඇති වන බලපෑම් සහ ප්‍රතිපෝෂණ බලපෑම් සැලකිල්ලට නො ගනිමින්, තනි තනි ආයතනවල අවදානම් පමණක් සැලකිල්ලට ගනු ලබන සූක්ෂ්ම විචක්ෂණශීලී ප්‍රවේශයක් නියාමනය සහ අධීක්ෂණය සඳහා යොදා ගැනීම, මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් නො වේ.

### (ආ) සාර්ව විචක්ෂණශීලී අධීක්ෂණ ක්‍රමවේදය හඳුන්වාදීම

ඒ අනුව, පද්ධතිමය අවදානම අවම කිරීම සඳහා, සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියෙහි ශක්තිමත්භාවය පිළිබඳ අවධාරණය කරනු ලබන සාර්ව විචක්ෂණශීලී ක්‍රමවේදයක් නියාමනය සහ අධීක්ෂණය සඳහා අනුගමනය කළ යුතු වේ. මෑතකාලීන මූල්‍ය අර්බුදයෙන් පසු ව හඳුන්වා දුන් බාසල් III වැනි නියාමන

ප්‍රතිසංස්කරණ මගින් ද සාර්ව විචක්ෂණශීලී සහ සූක්ෂ්ම විචක්ෂණශීලී ප්‍රවේශ අතර අන්තර් සම්බන්ධතාවන් අවධාරණය කර ඇත.

- පද්ධතිමය අවදානමෙහි කාල දෘෂ්ටිකෝණය (Time Dimension) සැලකිල්ලට ගෙන හඳුන්වා දෙනු ලබන මෙවලම්වලට උදාහරණ ලෙස තෝලන අනුපාතය, ආර්ථික චක්‍රයට ප්‍රතිවිරුද්ධ ව ගොඩ නැගිය යුතු ප්‍රාග්ධන ස්වාරක්ෂකය (Counter-Cyclical Capital Buffer) වැනි කාලානුරූපී ව වෙනස් වන ප්‍රාග්ධන අවශ්‍යතාවන්, බාසල් III යටතට ගැනෙන ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය වැනි ද්‍රවශීලතා ස්වාරක්ෂක සහ වටිනාකම් මත ණය අනුපාත සහ ආන්තික අවශ්‍යතා වැනි අවස්ථානුරූපී ව පනවනු ලබන නියාමන අවශ්‍යතා සහ කොන්දේසි සැලකිය හැකි ය.
- අවදානම් සංකේන්ද්‍රණය වීම් සහ අන්තර් සම්බන්ධතා ඇසුරෙන් පැන නගින පද්ධතිමය අවදානමෙහි හරස්කඩ දෘෂ්ටිකෝණය (Cross Section Dimension) සීමා කරන මෙවලම්වලට උදාහරණ ලෙස, ඉහළ අවදානමක් ඇති කළ හැකි ක්‍රියාකාරකම් සඳහා ඇඩි ප්‍රාග්ධන නියමයන් පැනවීම, මූල්‍ය ආයතනවල අවසරලත් ක්‍රියාකාරකම්වල විෂය පථය සීමා කිරීම සැලකිය හැකි ය. උදාහරණයක් ලෙස එක්සත් රාජධානියෙහි සර් ජෝන් වික්කර්ස් විසින් 2012 වසරේ දී ඉදිරිපත් කරන ලද ''වික්කර්ස් යෝජනාවලිය'' මගින්, ආයෝජන බැංකු කටයුතු, සාමාන්‍ය පාරිභෝගික බැංකු කටයුතුවලින් වෙන්කොට පවත්වාගෙන යා යුතු යැයි යෝජනා කරන ලදී.
- අධීක්ෂණ සහ නියාමන කටයුතු ඇඩි කිරීම තුළින්, සහ ඉහළ ප්‍රාග්ධන මට්ටම් පවත්වාගෙන යන ලෙස නියම කිරීම තුළින් නියාමන අධිකාරීන් විසින් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු සම්බන්ධයෙන් යොමු කරන අවධානය ඉහළ නංවා ඇත.
- මූල්‍ය පද්ධතියෙහි විවිධ කොටස් අතර පවතින අන්තර් සම්බන්ධතා නිරූපණය කිරීම සඳහා ජාල විශ්ලේෂණය සහ සමාකරණ අභ්‍යාස, නියාමන අධිකාරීන් විසින් යොදා ගැනීමට පටන් ගෙන ඇති අතර, බැංකුවල මූල්‍යමය ශක්තිමත්භාවය නිර්ණය කිරීම සඳහා ආතති පරීක්ෂණ අභ්‍යාස ද සිදු කරනු ලැබේ.

## 3. බැංකුවල අවදානම් ව්‍යුහයෙහි වෙනස්වීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

### (අ) නව අවදානම් මානයන් මතුවීම

අවදානම් පිළිබඳ මතවාදී වෙනස්වීම්, නව නියාමන රාමු සහ සංවර්ධිත රටවල දිගින් දිගට ම පැවති අඩු පොලී අනුපාත වැනි කරුණු මගින් බැංකුවල පශ්චාත්-අර්බුද හැසිරීම සහ ව්‍යාපාර ආකෘතිවල ස්වභාවය තීරණය කර ඇත. එම නිසා, බැංකුවල අවදානම් ව්‍යුහයන්හි සැලකිය යුතු වෙනස්වීම් සිදු වී ඇති අතර, මෙතෙක් සැඟ ව පැවති නව අවදානම් ක්ෂේත්‍ර ඉස්මතු වී, වැඩි අවධානයක් දිනාගෙන ඇත.

- සීඝ්‍රයෙන් හීන වන ලාභ ආන්තික සමඟ ලාභදායිත්වය වැඩි දියුණු කිරීම සඳහා එල්ලවන ඉහළ පීඩනය හේතුවෙන් උපාය මාර්ගික අවදානමෙහි වැදගත්කම ඉහළ ගොස් ඇත.
- එ මෙන් ම, නිරන්තරයෙන් පරිණාමනය වන සුළු ස්වභාවයක් පවතින සයිබර් අවදානම කළමනාකරණය කිරීමේදී ද බැංකුවලට අභියෝගවලට මුහුණ දීමට සිදු වී ඇත. මේ වන තෙක් සයිබර් ප්‍රහාර හේතුවෙන් සිදු වී ඇති හානි සීමිත වුවත්, එමගින් දිගුකාලීන අභියෝග ඉස්මතුවීමට ඇති සම්භාවිතාව ඉහළ ය.
- ආකෘති අවදානම, මුදල් විශුද්ධිකරණ අවදානම, වෙළෙඳපොළ භාවිතාව පිළිබඳ අවදානම සහ නෛතික සහ අනුකූලතා අවදානම වැනි අංශවල වැදගත්කම ද ඉහළ ගොස් ඇත.

### (ආ) වඩා අවදානම් සංවේදී වන පරිදි සහ ව්‍යාපාර ආකෘති මත පදනම් වන පරිදි අධීක්ෂණ ක්‍රමවේදය ශක්තිමත් කිරීම

මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා, නිසි පරිදි පාලනය වන ආයතනවල ස්වයං විනය ප්‍රමාණවත් ය යන පූර්ව නිගමනය මත පදනම් ව සිදු කරන ලද, ලිහිල් සහ පසුගිය සිදුවීම් මත පදනම් වූ අධීක්ෂණ ක්‍රමවේදයෙන් මේ වන විට අධීක්ෂණ අධිකාරීන් බැහැර වී ඇත.

- අධීක්ෂණ සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් සහ සුදුසු පූර්ව අධීක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමේ අපේක්ෂාවෙන්, අනුකූලතාව පදනම් කරගත් ක්‍රමවේදයෙන් බැහැර ව අවදානම් මත පදනම් වූ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට නියාමන අධිකාරීන් කටයුතු කරමින් සිටී.

- මූල්‍ය ආයතන, කාර්යක්ෂම ලෙස සහ තිරසාර පැවැත්මකින් යුතුව පවත්වාගෙන යන බව තහවුරු කිරීම සඳහා, නියාමන ක්‍රමවේදයන්හි දූරදර්ශී බව, දැඩි බව සහ ගතික බව වැඩි දියුණු කරන ලද අතර, බැංකුවල අවදානම් ව්‍යුහය සහ ව්‍යාපාර ආකෘතිය මත පදනම් ව, එකිනෙක බැංකුවට ආවේනික අධීක්ෂණ ක්‍රියාවලියක් සිදුකිරීම සඳහා එම ක්‍රමවේද ප්‍රතිනිර්මාණය කරන ලදී.

## 4. නියාමන අධිකාරීන් අතර සහයෝගීතාව වර්ධනය කිරීම

දැවැන්ත ගෝලීය මූල්‍ය ආයතන සමූහ බිහිවීම සහ මූල්‍ය පද්ධතියේ විවිධ අංශ අතර ඇති අන්තර් සම්බන්ධතා හේතුවෙන්, දේශීය ව සහ ජාත්‍යන්තර වශයෙන්, අන්තර්-නියාමන සහයෝගීතාව වර්ධනය කිරීමට නියාමන අධිකාරීන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

### (අ) කේවල අධීක්ෂණ ව්‍යුහය සහ බහුවිධ අධීක්ෂණ ව්‍යුහය

මූල්‍ය ආයතනවල අවදානම් නිරීක්ෂණය කිරීම සඳහා සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවට සැබෑ හෝ විභව බලපෑම් එල්ල කළ හැකි අනතුරුවලට ප්‍රතිචාර දැක්වීම සඳහා, කේවල අධීක්ෂණ ව්‍යුහය වඩා ඵලදායී බව ඇතැම් රටවල්වල විශ්වාසය වේ. උදාහරණයක් ලෙස, එක්සත් රාජධානිය, ජර්මනිය, අයර්ලයන්තය, චීනය සහ භූතානය වැනි රටවල් කේවල අධීක්ෂණ ව්‍යුහයක් පිහිටුවා ඇත.

- මූල්‍ය ආයතන සමූහවල ඒකාබද්ධ අධීක්ෂණ කටයුතු සිදු කිරීමේ දී සහ නියාමන ව්‍යුහයන්හි පවතින විෂමතා තුළින් පැන නගින ගැටලු අවම කිරීමේ දී, මෙ වැනි ක්‍රමවේදවල සාපේක්ෂ ඵලදායීතාව ඉහළ ය.

- එ සේ වුව ද, විවිධ මූල්‍ය අතරමැදි ආයතනවලට ආවේණික ලක්ෂණ හඳුනා ගැනීමේ දී සහ එයට අදාළ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමේ දී කේවල අධීක්ෂණ ආයතනයකට වඩා අදාළ අංශය පිළිබඳ විශේෂඥ දැනුමක් පවතින ආයතන වඩා සුදුසු බව බහුවිධ අධීක්ෂණ ව්‍යුහයක් අනුමත කරන විද්වතුන්ගේ මතය වේ.

- බහුවිධ නියාමන ව්‍යුහයක් පිහිටුවා ඇති බොහෝ රටවල්, නියාමන අධිකාරීන් අතර සන්නිවේදනය සහ ප්‍රතිපත්තිමය සහයෝගීතාව තහවුරු කිරීම සඳහා ඵලදායී යාන්ත්‍රණ ඇති කරමින් සිටී. මෙ වැනි පියවර අතර, එක් එක් අධීක්ෂණ ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත අන්තර්-නියාමන සංවිධාන පිහිටුවීම, පොදු කරුණු සඳහා ක්‍රියාකාරී කණ්ඩායම් ඇති කිරීම, තොරතුරු හුවමාරු කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම්වලට එළැඹීම ආදිය වේ.

### (ආ) මෑතකාලීන මූල්‍ය අර්බුදවලට පසු ව අධීක්ෂණ සහයෝගීතාව වර්ධනය කිරීම

- **යුරෝපා සංගමය:** විශේෂයෙන්ම මුදල් සංගමයක් තුළ, එක් රටක මූල්‍ය අංශයෙහි පවතින ගැටලු තවත් රටක් කෙරෙහි කෙතරම් වේගයෙන් සහ ප්‍රබල ලෙස පැතිර යන්නේ ද යන්න පිළිබඳ ව, යුරෝපා අර්බුදයෙන් පසු ව සිදු කළ අධ්‍යයනයන්හි දී හෙළි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, යුරෝපා මහ බැංකුව සහ සහභාගී වන යුරෝපීය රටවල්වල ජාතික අධීක්ෂණ ආයතනවලින් සමන්විත කේවල අධීක්ෂණ යාන්ත්‍රණයක් 2014 නොවැම්බර් මස දී පිහිටුවන ලදී.

- **එක්සත් රාජධානිය:** මෙයට පෙර පැවති මූල්‍ය සේවා අධිකාරිය, මූල්‍ය භාවිතය පිළිබඳ අධිකාරිය සහ විචක්ෂණශීලී නියාමන අධිකාරිය යන නව නියාමන ආයතන ද්විත්වයෙන් ප්‍රතිස්ථාපනය කරන ලදී. එංගලන්ත මහ බැංකුවෙහි පූර්ණ හිමිකම සහිත පාලිත සමාගමක් වන විචක්ෂණශීලී නියාමන අධිකාරිය මූල්‍ය අතරමැදිකරුවන් පිළිබඳ විචක්ෂණශීලී නියාමනය සහ අධීක්ෂණය සිදු කරන අතර, මූල්‍ය භාවිතාව පිළිබඳ අධිකාරිය පාරිභෝගික ආරක්ෂණය සහ වෙළෙඳපොළ භාවිතය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන ස්වාධීන ආයතනයකි. පද්ධතිමය අවදානම් හඳුනා ගැනීමට, නිරීක්ෂණය කිරීමට සහ ඒ පිළිබඳ

නිසි පියවර ගැනීමට එංගලන්ත මහ බැංකුව යටතේ මූල්‍ය ප්‍රතිපත්ති කමිටුව පිහිටුවන ලදී.

**(ඇ) අන්තර් දේශ සීමා තොරතුරු හුවමාරු කර ගැනීම සහ මව් රටෙහි සහ විදේශ රටෙහි නියාමන ආයතන අතර ඇති සම්බන්ධතා**

බැංකු සමූහයන්ගේ සීඝ්‍ර භූගෝලීය ව්‍යාප්තිය හේතුවෙන්, අන්තර් දේශ සීමා බැංකු සමූහ අධීක්ෂණය කිරීමේ සහ අර්බුද අවස්ථාවන්හි දී නිවාරණ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේ සංකීර්ණතාව ඉහළ ගොස් ඇත.

- බැංකු සමූහවල ඵලදායී අධීක්ෂණය වෙනුවෙන් තොරතුරු හුවමාරු කර ගැනීම හා සහයෝගයෙන් කටයුතු කිරීම මගින් ද, අර්බුද අවස්ථාවන් ඵලදායී ලෙස හැසිරවීම මගින්, මව් රටෙහි සහ විදේශ රටෙහි නියාමන ආයතන අතර සම්බන්ධතා වර්ධනය කිරීම සඳහා අධීක්ෂණ අධිකාරීන් යොමු වී ඇත. රහසිගත තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අවිධිමත් හෝ විධිමත් (උදා:- අවබෝධතා ගිවිසුම්) ක්‍රමවේදයන් ද මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.
- **නියාමන විද්‍යාල බිහිකිරීම:** ප්‍රමාණාත්මක ලෙස අන්තර් දේශ සීමා මෙහෙයුම් කටයුතු සිදු කරන බැංකු සමූහයන් කාර්යක්ෂම ව අධීක්ෂණය කිරීම සඳහා, මව් රටෙහි නියාමන අධිකාරීන් විසින් එකිනෙක බැංකුවලට වෙන් වූ විශේෂිත නියාමන විද්‍යාල බිහි කරයි. එම බැංකු සමූහවලට අදාළ විදේශ රටවල අධීක්ෂණ අධිකාරීන් එම නියාමන විද්‍යාලවලට ඇතුළත් කරගනු ලැබේ. එම නිසා, නියාමන කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන මාධ්‍යයක් ලෙස නියාමන විද්‍යාල ක්‍රියාත්මක වේ. (උදා. ජී 20 රටවල්, යුරෝපා සංගමය, ඉන්දියාව හා සිංගප්පූරුව)

## 5. අර්බුදවලට සූදානම් වීම සහ නිවාරණ ක්‍රමවේද

ගෝලීය මූල්‍ය අර්බුදය සමයේ දී මහජන විශ්වාසය හීනවීමට පිළියමක් ලෙස, බොහෝ රටවල් තැන්පතු රක්ෂණ ක්‍රම සහ ප්‍රතිසාධන හා නිවාරණ ක්‍රියාමාර්ග වැනි මූල්‍ය සුරක්ෂිතතා ක්‍රමවේද ශක්තිමත් කොට ඇති අතර, බැංකුවලට අර්බුදවලට සූදානම් වීමේ විස්තරාත්මක සැලසුම් සකස් කිරීමට අනුබල ලබා දී ඇත.

- ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, හොංකොං, ජර්මනිය, මැලේසියාව සහ සිංගප්පූරුව වැනි රටවල් මෙම ගෝලීය ප්‍රතිසංස්කරණ හමුවේ තම තැන්පතු රක්ෂණ ආවරණ ඉහළ නංවා ඇත.
- හදිසි ද්‍රවශීලතා සහාය ලබා දීම, මූල්‍ය ආයතන බිඳ වැටීම් නිවාරණය කිරීම, තැන්පතුකරුවන් සහ ආයෝජකයන් ආරක්ෂා කිරීම සහ විධිමත් අවිනිශ්චිතතා සැලසුම් වැනි කාලීන නියාමන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ව අවධානය යොමු කරමින්, රටවල් වැඩි සංඛ්‍යාවක් අර්බුද සමාකරණ අභ්‍යාස (Crisis Simulation Exercises) සිදුකරයි.
- 2012 වසරේ දී, බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුව විසින් ඵලදායී බැංකු අධීක්ෂණයක් සඳහා වන පූර්ව කොන්දේසියක් ලෙස ප්‍රතිසාධන සහ නිවාරණ සැලසුම් හඳුනා ගෙන ඇත. එම නිසා, අර්බුද තත්ත්වයන්ට අනුරූපී ව විවිධ ප්‍රතිසාධන සහ නිවාරණ ක්‍රියාමාර්ග සකස් කිරීමට සහ භාවිතයට ගැනීමට නියාමන අධිකාරීන් යොමු වී ඇත.

## 6. පාරිභෝගික ආරක්ෂණ ක්‍රමවේදයන් සහ මූල්‍ය ආයතනවල වෙළෙඳපොළ භාවිතය වැඩි දියුණු කිරීම

ගෝලීය මූල්‍ය අර්බුදයෙන් සහ ප්‍රසිද්ධියට පත් වූ වෙළෙඳපොළ අවභාවිතයන් කිහිපයකින් අනතුරු ව, නියාමන අධිකාරීන් විසින් පාරිභෝගික ආරක්ෂණ නීති දැඩි කරන ලදී. මූල්‍ය වෙළෙඳපොළවල් පාරිභෝගිකයන්ට වඩා සුරක්ෂිත කිරීමේ අරමුණින්, නියාමන අධිකාරීන් විසින් නව ආයතනික ව්‍යුහයන් හඳුන්වා දෙන ලද අතර, මෙයට උදාහරණ ලෙස, එක්සත් රාජධානියෙහි මූල්‍ය භාවිතාව පිළිබඳ අධිකාරිය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ පාරිභෝගික මූල්‍ය ආරක්ෂණ කාර්යාංශය දැක්විය හැක. ඉන්දියාව, මැලේසියාව හා සිංගප්පූරුව යන කලාපීය රටවල ද මූල්‍ය වෙළෙඳපොළවල විනිවිදභාවය සහ සුපිළිපන්භාවය, සාධාරණ ව සැලකීම, හෙළිදරව් කිරීම් සහ මූල්‍ය අධ්‍යාපනය යනාදිය පිළිබඳ නියාමන රාමු ශක්තිමත් කර ඇත.

## 7. ශ්‍රී ලංකාව තුළ නියාමන අධිකාරීන්හි භූමිකාවේ විකාශනය

- **අධීක්ෂණ සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරු කර ගැනීම:** ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය නියාමන අධිකාරීන් කිහිපයක් විසින් නියාමනය

කරනු ලබන අතර, මෙම විවිධ නියාමන ආයතන අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමට බොහෝ ප්‍රයත්න දරා ඇත. උදාහරණයක් ලෙස, මූල්‍ය අංශයේ ක්‍රමවත් සංවර්ධනය හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ශක්තිමත් කිරීමට අදාළ සුදුසු ප්‍රතිපත්තිමය විධානයන් පැවතීම තහවුරු කර ගැනීම සඳහා 2007 වසරේ දී, මූල්‍ය අංශයේ ප්‍රධාන නියාමන අධිකාරීන්ගේ සහභාගීත්වයෙන්, අන්තර් නියාමන ආයතනික සභාව, මූල්‍ය අංශ අධීක්ෂණ කමිටුව ලෙස නැවත පිහිටුවන ලදී. මේ සඳහා පහසුකම් සැලසීමට, මූල්‍ය අංශයේ නියාමන අධිකාරීන් අතර තොරතුරු හුවමාරු කිරීම පිළිබඳ යෝජිත පනත කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, මේ වන විට කෙටුම්පත් කරමින් පවතී. 2015 වසරේ දී, මූල්‍ය අංශය පිළිබඳ අධීක්ෂණ කාර්යභාරය වෙත මූලිකත්වයක් දෙමින්, අන්තර් නියාමන ආයතනික සභාව නැවත පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව මේ වනවිට, පාකිස්තානු සහ ඉන්දීය මහ බැංකු, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමග අවබෝධතා ගිවිසුම්වලට එළැඹී ඇත.

- **සාර්ව විචක්ෂණශීලී අධීක්ෂණය ශක්තිමත් කිරීම:** ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පද්ධතිමය අවදානම් කල්තියා හඳුනා ගැනීම සහ ඇගයීම සඳහා බැංකු අංශයේ සහ මූල්‍ය අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශක, මූල්‍ය වෙළෙඳපොළ ස්ථායීතා දර්ශක සහ සාර්ව ආර්ථික ස්ථායීතා දර්ශක සංවර්ධනය කරන ලදී. තව ද, දැඩි එහෙත් සිදු විය හැකි සාර්ව ආර්ථික කම්පනවලට ඔරොත්තු දීමට මූල්‍ය පද්ධතියට ඇති හැකියාව ඇගයීම සඳහා සාර්ව ආතති පරීක්ෂාවන් පවත්වන ලදී. පද්ධතිය තුළ ගොඩ නැගෙන අවදානම්වලට පූර්ව ප්‍රතිචාර දක්වමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට, වටිනාකම මත ණය අනුපාත, උපරිම ණය වර්ධන සීමාවන්, ආනයන මත ආන්තික අවශ්‍යතාවන් පැනවීම යනාදී සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත.
- **බාසල් III ප්‍රාග්ධන හා ද්‍රවශීලතා ප්‍රමිති ක්‍රියාවට නැංවීම:** වත්මන් නියාමන වර්ධනයන්ට අනුකූල ව, බාසල් III යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2015 වසරේ දී ක්‍රියාවට නංවන ලද අතර, බාසල් III ප්‍රාග්ධන ප්‍රමිතීන් අන්තර්ජාතික කාල රාමුවලට අනුකූල ව හඳුන්වාදීමට නියමිත ය.
- **නියාමන රාමුව වැඩි දියුණු කිරීම:** 2015 වසර තුළ දී, බැංකු හා බැංකු නො වන මූල්‍ය ආයතනවලට අදාළ ව පවත්නා නියාමන ප්‍රවේශය තවදුරටත් අවදානම් කෙරෙහි සංවේදී සහ පූර්ව ක්‍රියාමාර්ග ගන්නා ආකාරයට වැඩි දියුණු කරන ලදී. ඉදිරිය මත පදනම් වූ නව ක්‍රමවේදය බැංකුවල ව්‍යාපාර ව්‍යුහය වෙත අවධානය යොමුකොට බැංකුවල කාර්යක්ෂමතාව හා තිරසාර බවට බලපෑම් කළ හැකි අවදානම් හඳුනා ගැනීමට යොමු වී ඇත. මෙම සමයේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනයේ දී හඳුනාගත් ගැටලු නිරාකරණය කිරීම සඳහා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත උප කමිටු සක්‍රීය ව දායක කර ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය සහ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා, බැංකු සඳහා පවතින නියාමන සහ අධීක්ෂණ රාමුව නිරතුරු ව ම අන්තර්ජාතික වර්ධනයන් සහ මූල්‍ය අංශයේ හා මූර්ත ආර්ථිකයේ වෙනස්වන අවශ්‍යතාවලට අනුරූප ව ඇගයීමට, සමාලෝචනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ඇත.

*මූලාශ්‍ර:*


Caruana, J (2015), Financial reform and the role of regulators: Evolving markets, evolving risks, evolving regulation

Kawai, M and Prasad, E, (2013), New Paradigms for Financial Regulation: Emerging Market Perspectives

Prudential Regulation Authority, (2013), The Prudential Regulation Authority's approach to banking supervision

World Bank, (2014), Global Survey on Consumer Protection and Financial Literacy: Oversight Frameworks and Practices in 114 Economies

Basel Committee on Banking Supervision


(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015)

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.